**ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2015 වර්ෂය**

---

ශීර්ෂය 265 - මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 සැප්තැම්බර් 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 389.32 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 311.70 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 77.62 ක් හෙවත් සියයට 20 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | |
| පුනරාවර්තන | 195.22 | 193.40 | 1.82 | 01 |
| මූලධන | 194.10 | 118.30 | 75.80 | 39 |
| එකතුව | 389.32 | 311.70 | 77.62 | 20 |

(අ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

වෙනත් අමාත්‍යාංශ 15 ක් හා දෙපාර්තමේන්තු 08 ක් විසින් එකතුව රු. මිලියන 2,740.75 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,572.73 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,168.02 ක මුදලක් ඉතිරි වී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26501 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 12.5 | 11.5 | 7.5 | 10.5 | 4.5 | 39.2 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අංක 6003/0000/00/0041/0000/00 දරන පොදු තැන්පත් ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 15.56 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණ

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 3 ඡේදයේ සඳහන් කර ඇත.

# 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව විගණන නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891 | පවත්වා නොතිබුණි. |
| (ආ) | කෙටි නිවාඩු ලේඛනය හා ප්‍රමාද වී පැමිණීමේ ලේඛනය | 1994 ජනවාරි 21 දිනැති අංක 06/94 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |

**3.2 විසර්ජන ගිණුම**

**3.2.1 අයවැය විචලනය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරාවර්තන විෂයයන් 3 ක හා ප්‍රාග්ධන විෂයයන් 3 ක එකතුව රු.2,414,585 ක් වූ පිළිවෙලින් සියයට 12 සිට සියයට 73 ක පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය වූ අතර ඒ අනුව වර්ෂය සඳහා අයවැය ලේඛනය විධිමත්ව පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

2015 දෙසැම්බර් 31 දිනට අංක 26501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශයට අදාළ විගණන නියැදි පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4 වගන්තිය ප්‍රකාරව සේවය හැරගිය හෝ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 05 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.486,681 ක් වූ හිඟ ශේෂයන් අයකර ගැනීමට හෝ සුදුසු ගැලපීම් සිදුකිරීමට කටයුතු කර නොතිබුණි.

**3.4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**3.4.1 විගණන හා කළමනාකරණ කමිටු**

විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවම වශයෙන් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. කෙසේ වුවද, මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පහත සඳහන් වත්කම් භාවිතා කර නොතිබූ බව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්කාර්යව පැවති කාලය |
|---|---|---|---|
| | | රු. | වර්ෂ |
| ඉඩම් | 02 | 1,100,000 | - |
| ගොඩනැගිලි | 17 | ලබාගෙන නැත | 04-50 |
| මෝටර් වාහන | 03 | ලබාගෙන නැත | 05 |
| යතුරුපැදි | 07 | ලබාගෙන නැත | 02 |
| ජල පෙරන | 05 | ලබාගෙන නැත | 01 |
| ජලය පිරිසිදු කිරීමේ යන්ත්‍රය | 04 | 312,800 | 02 |
| අල්මාරිය (වීදුරු සහිත) | 01 | ලබාගෙන නැත | - |
| ජල ටැංකි | 06 | ලබාගෙන නැත | මාස 06 |

**3.6 අනුකූල ගෙවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවල යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| (i) | මුදල් රෙගුලාසි 136, 137, 138, 139 හා 257 | 18,767,780 | මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු.1,876,780 ක් වූ ගෙවීම් වවුචර් 3 ක් සඳහා විධිමත් අනුමැතියකින් හා සහතික කිරීමකින් තොරව ගෙවීම් කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 139(2), (3) හා (4) | 162,000 | මන්තායි බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.162,000 ක්වූ ගෙවීම් සඳහා ගෙවීම් ලද බවට ලදුපත් ලබාගෙන නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 880 හා 881 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක නිලධාරීන් 43 දෙනෙකුගෙන් හා රියදුරන් තිදෙනෙකුගෙන් ඇප තැන්පතු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| (i) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක මෝටර් වාහන 10 ක් සඳහා ඉන්ධන පරිභෝජනය මාස 06 කට වරක් පරීක්ෂා කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය | 9,189 | ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍රයේ දැක්වෙන වේලාවන් පරීක්ෂා කිරීම මඟින් නිවාඩු දින වැටුප් ගෙවීම් සඳහා තහවුරු කරගත යුතුය. කෙසේ වුවද, ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍රයේ සලකුණු කරන ලද වේලාව පිළිබඳ සැලකීමෙන් තොරව මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් රු.9,189 ක් වූ නිවාඩු දින වැටුප් ගෙවා තිබුණි. |
| (iii) | 1994 ජනවාරි 21 දිනැති අංක 06/94 දරන චක්‍රලේඛය | | 2015 දෙසැම්බර් මාසයේදී නිලධාරීන් 45 දෙනෙකුගේ ප්‍රමාද වී පැමිණීම් විගණන පරීක්ෂණවලදී අනාවරණය විය. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි. |

**3.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළව සිදු කරන ලද නියැදි පරීක්ෂණ වලදී පහත නිරීක්ෂණයන් කරන ලදී.

(අ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදය

2015 දෙසැම්බර් 31 දිනට නිම කිරීමට අපේක්ෂා කරන ලද දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් වැඩ (අදියර 1) රු.මිලියන 82.7 ක් වැය කිරීමෙන් පසුවත් සම්පූර්ණ කර නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ආ) විධිමත්ව සම්පූර්ණ නොකරන ලද ව්‍යාපෘති

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

අහත්තායි මුරිප්පු පෙර පාසල ඉදිකිරීම

(i) ප්‍රමාණ පත්‍ර විෂයයන්වල (විෂය අංක 05,07, 08, 09, 11, 14, 15, 17) වටිනාකම අතර රු.241,106 ක් වූ වෙනස්කම් නිරීක්ෂණය වූ අතර වැඩ වටිනාකම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා නොගත් වැඩ කොන්ත්‍රාත්කරු විසින් සිදු කර තිබුණි.

(ii) ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටත බිත්තිවල තීන්ත ආලේප කර නොතිබූ බැවින් පෙර පාසල සම්පූර්ණයෙන් භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. ප්‍රමාණ පත්‍රවල විෂය අංක 16 අනුව, තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය මුදල රු.55,390 ක් විය.

සින්න පුලච්චි පොට්කර්නි ප්‍රජා මධ්‍යස්ථානය ඉදිකිරීම

(i) ප්‍රජාශාලාව ඉදිකිරීමට අදාළ ප්‍රමාණ පත්‍රවල අංක 07,09,11,14,15,18 සහ 21 යන ඇස්තමේන්තුගත විෂයයන් හා කොන්ත්‍රාත්කරු විසින් නිමකරන ලද වැඩ අතර රු.235,267 ක විචලනයන් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ලේ ඇතුළත හා පිටත බිත්තිවල තීන්ත ආලේප කර නොතිබූ බැවින් හා දොර යතුරු සවිකර නොතිබූ බැවින් ප්‍රජා මධ්‍යස්ථානය භාවිතා කිරීමට නොහැකිවී තිබුණි. ප්‍රමාණ පත්‍ර අංක 16 සහ අංක 22 අනුව, තීන්ත ආලේප කිරීම සඳහා අවශ්‍ය මුදල පිළිවෙලින් රු.55,390 ක් හා රු.8,500 ක් විය.

තලෙයි මන්නාරම නිවාස යෝජනා ක්‍රම මාර්ගයේ අලුත්වැඩියාව

------------------------------------------------------------------------------

මාර්ගය අලුත්වැඩියා කිරීමේදී බොරලු පස් ඇතිරීමෙන් පසු මාර්ගය තද කිරීම සඳහා මාර්ග තලනයක් භාවිතා කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වැස්සෙන් බොරලු සේදී ගොස් තිබූ අතර මාර්ගය මතුපිට වලවල් හැරී තිබුණි. වර්ෂා කාලයේදී මාර්ගය මඩ වී තිබූ හෙයින් මාර්ගය භාවිතා කරන්නන්හට එය භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. එබැවින්, මේ සඳහා වැය කරන ලද රු.851,630 ක මුදල ඵල රහිත වී තිබුණි.

ඉරුක්කලම්පිටි කල්ලඩි මාර්ගයේ අලුත්වැඩියාව

---------------------------------------------------------

(i) අදාළ මාර්ගයේ මීටර් 950 ක් අලුත්වැඩියා කිරීම සඳහා රු.976,930 ක මුදලක් වැයකර තිබුණි. කෙසේ වුවද, ප්‍රධාන මාර්ගයේ මීටර් 500 ක් හා අතුරු මාර්ගයේ මීටර් 115 ක් වශයෙන් මාර්ගයේ මීටර් 615 ක් පමණක් අලුත්වැඩියා කර තිබුණි.

(ii) අලුත්වැඩියා කරන ලද මාර්ගයේ මීටර් 500 ක් පමණ වැසි ජලයෙන් සේදී ගොස් තිබූ අතර මාර්ගයේ වළවල් හැරී තිබුණි. දිග මීටර් 135 ක ප්‍රමාණයක මාර්ගයේ පළල මීටර් 3.5 ක් විය යුතු වුවත් එය මීටර් 2.5 ක් පමණක් විය.

(iii) මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා යොදාගත් බොරළුවල තථ්‍ය ප්‍රමාණය ඝන මීටර් 318.45 ක් විය. එය මිනුම් වාර්තාවේ ඝන මීටර් 399 ක් ලෙස දක්වා තිබූ බැවින් රු.140,455 ක මුදලක් බොරළු සඳහා වැඩිපුර ගෙවා තිබුණි.

ආට්කාට්ටිවෙලි ප්‍රජා මධ්‍යස්ථානය ඉදිකිරීම

----------------------------------------------------

(i) ප්‍රජා ශාලාව ඉදිකිරීම සඳහා ප්‍රමාණ පත්‍රවල (අංක 16,21,22) දැක්වෙන වටිනාකම හා කොන්ත්‍රාත්කරු විසින් නිම කරන ලද වැඩවල වටිනාකම අතර වූ රු.190,330 ක වෙනස සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) ප්‍රජා මධ්‍යස්ථානයේ ප්‍රමාණ පත්‍රවල අංක 21 විෂයය සම්බන්ධයෙන් ඉටුකරන ලද වැඩ ප්‍රමාණය මිනුම් වාර්තාවේ වැඩිපුර දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු.84,312 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වැඩ 2015 ඔක්තෝබර් 14 දින නිම කර තිබුණද, ජනෙල්වලට සවිකළ යුතු පියන් සවිකර නොතිබූ අතර ඒවා මධ්‍යස්ථානයේ තබා තිබුණි. ඒ සඳහා රු.63,000 ක මුදලක් ගෙවා තිබුණි.

**3.8 බැංකු ගිණුම මෙහෙයවීමේ අඩුපාඩු**

**-----------------------------------------**

**මුදල් නොකළ චෙක්පත්**

**----------------------------**

චෙක්පත් නිකුත් කළ දින සිට මාස 06 කට වැඩි කාලයක් මුදල් නොකර පැවතුණු රු.221,757 ක් වටිනා චෙක්පත් 48 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.9 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**-----------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 32 | 20 | 12 |
| (iii) | ද්විතීයික මට්ටම | 362 | 270 | 92 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 56 | 38 | 18 |
| (v) | වෙනත් (අනියම්) | - | 01 | - |
| | එකතුව | **451** | **330** | **122** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති පුරප්පාඩු 122 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) තාක්ෂණික නිලධාරි හා සැලසුම් ශිල්පී තනතුරු අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් කර තිබුණි. එහෙත් මේ දක්වා සුදුසු පුද්ගලයන් එම තනතුරු සඳහා පත්කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉදිකිරීම් හා කොන්ත්‍රාත් වලට අදාළ වැඩ කාර්යක්ෂමව ඉටුකර නොතිබුණි.

(ඇ) 1 ශ්‍රේණියේ කළමනාකරණ සහකාර තනතුර සඳහා අනුමත සේවක සංඛ්‍යාව 04 ක් වුවද, 10 දෙනෙකු පත්කර තිබූ අතර ඒ අනුව අතිරික්ත සේවක සංඛ්‍යාව 06 ක් විය.